මගේ අංක :- ARCH/HO/ADM/1/15/46 (III)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

2026.01. 20

ප්‍රධාන කාර්යාලයේ සියලු අංශ ප්‍රධානීන් සහ
සියලු ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකවරුන් වෙත,

**<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා සේවා පළපුරුද්ද හා කුසලතා මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රසිද්ධ කිරීම.</u>**

අංක ARCH/HO/ADM/1/15/46(III) හා 2025.12.31 දිනැතිව (2026.01.06 දිනැති සංශෝධනය සමගින්) පළකරන ලද ඉහත තනතුරු සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි සඳහන් අයදුම්පත් යොමු කිරීමේ අවසන් දිනය 2026 පෙබරවාරි මස 02 දින දක්වා දීර්ඝ කරනු ලබන බව මෙයින් කාරුණිකව දන්වමි.

02. ඒ අනුව අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ටී.ජී. සෙනරත් වික්‍රමසිංහ
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

ටී.ජී. සෙනරත් වික්‍රමසිංහ
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

දුරකථන අංකය - 0112667155
ෆැක්ස් අංකය - 0112667155
විද්‍යුත් තැපැල -admn.archdept@gmail.com

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතාව මත උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) තනතුරේ පවතින පුරප්පාඩු 08ක් හා විශේෂ ශ්‍රේණියේ සැලසුම් ශිල්පී තනතුරෙහි පුරප්පාඩු 04ක් සම්පූර්ණ කිරීම සඳහා සක්‍රීය සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට මෙම උසස්වීම් බලාත්මක වේ.

01. සපුරාලිය යුතු සුදුසුකම් :

1.1 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ MN-03 වැටුප් ක්‍රමයෙහි, අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ - ඛණ්ඩ 2 ගණයෙහි, I ශ්‍රේණියේ අවුරුදු 06ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා නියමිත වැටුප් වර්ධක 06 උපයාගෙන තිබීම.

1.2 උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 / 1/2020 (I) හා 1/2020(II) අනුව සුදුසුකම් සපුරා තිබීම.

1.3 අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙර වූ වසර හයක් (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1.4 තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
(තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 8 ඡේදයේ සටහන අනුව 2013.06.01 දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර 5ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් III වන කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)

1.5 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

02. වැටුප් පරිමාණය :

රා.ප.ච. 10/2025 අනුව MN-7-2025 වැටුප් කේතයට අදාළව ගෙවනු ලැබේ.

03. බඳවා ගන්නා ආකාරය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන මෙ සමඟින් අමුණා ඇති ලකුණු පරිපාටිය ප්‍රකාරව, අයදුම්කරුවන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාව සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණ දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

04. සේවා කොන්දේසි :

මූල් පත්වීම් ලිපියෙහි සඳහන් සියලුම කොන්දේසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1930/12 දරන 2015.09.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 සහ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ද අදාළ වේ.

පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තමාගේ අධීක්ෂණ නිලධාරී මඟින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, තැ.පෙ. අංක 532, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට 2026.01.19. දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

දිනය : 2025.12.10

.................................................................

ලේකම්
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
(නිල මුද්‍රාව)

**ප්‍රින්ස් සේනාධීර**
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශය
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ උසස් කිරීම සඳහා වූ ලකුණු පරිපාටිය

<table>
<tr><th>අ.අ.</th><th>අනුමත ලකුණු පරිපාටිය</th><th>ලකුණු</th><th>මුළු ලකුණු</th></tr>
<tr><td>01.</td><td><u>සේවා පළපුරුද්ද සඳහා :</u><br>• අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයෙහි, I ශ්‍රේණියේ අවුරුදු 06ක සතුටුදායක සේවා කාලයෙන් පසුව එළඹෙන අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. වැඩිම අමතර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයදුම්කරුට උපරිම ලකුණු ප්‍රමාණය හිමිවන අතර අනෙකුත් අයදුම්කරුවන්ට ඊට සමානුපාතිකව ඔවුන්ගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට ලකුණු ලබාදෙනු ලැබේ.<br><br><u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු</u> / වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු x12 + මාස) X අදාළ නිලධාරියාගේ වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය</td><td>50</td><td>50</td></tr>
<tr><td rowspan="4">02.</td><td><u>කුසලතාව සඳහා :</u><br>2.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් (ලකුණු 25)<br>2.1.1 වාස්තු විද්‍යා/ ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ අතිරේක අධ්‍යාපන සුදුසුකම් (ලකුණු 15)<br>I. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියට - ලකුණු 15<br>II. අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට - ලකුණු 10<br>III. අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවකට - ලකුණු 08<br>IV. අදාළ ක්ෂේත්‍රයේ සහතිකපත්‍ර පාඨමාලාවකට - ලකුණු 04<br><br>2.1.2 පරිගණක සාක්ෂරතාව (උපරිම ලකුණු 10)<br>• පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - ඩිප්ලෝමා හෝ ඊට ඉහළ - ලකුණු 10<br>• පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - සහතික පත්‍ර - ලකුණු 7.5<br>• සාමාන්‍ය පරිගණක පුහුණුව - ඩිප්ලෝමා - ලකුණු 05<br>• සාමාන්‍ය පරිගණක පුහුණුව - සහතික පත්‍ර - ලකුණු 2.5</td><td>25</td><td rowspan="4">50</td></tr>
<tr><td>2.2 ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හෝ වැඩමුළු සඳහා (උපරිම ලකුණු 10)<br>• දෙදින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා - ලකුණු 02<br>• එක්දින වැඩමුළු/පාඨමාලා - ලකුණු 01</td><td>10</td></tr>
<tr><td>2.3 විශේෂ කුසලතා (උපරිම ලකුණු 10)<br>• තම තනතුරට අදාළ ක්ෂේත්‍රයේ විශේෂ සුදුසුකම් සඳහා (පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන, තත්ත්ව පරීක්ෂණ වාර්තා, පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ සැලසුම් ආදිය ඉදිරිපත් කිරීමේදී එක් වාර්තාවකට ලකුණු 02 බැගින් උපරිම වාර්තා 05ක් සඳහා)</td><td>10</td></tr>
<tr><td>2.4 සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය</td><td>05</td></tr>
<tr><td colspan="3"></td><td>100</td></tr>
</table>

සැ.යු :

i. අයදුම්කරුවන් විසින් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර සම්පූර්ණ කර ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු පිරිනැමේ.

ii. බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සලකා නොබැලූ සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

iii. ඉහත 2.1 යටතේ අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදීමේදී උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

iv. ඉහත සියලුම ඩිප්ලෝමා සහ සහතික පත්‍ර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ ආයතනයකින් පිරිනමා ඇති හෝ බාහිර ආයතනයකින් පිරිනමා ඇත්නම් පිළිවෙළින් ඩිප්ලෝමා NVQ 5 හෝ ඊට ඉහළ සහ සහතික පත්‍ර NVQ 3හෝ ඊට ඉහළ මට්ටමේ විය යුතු ය. ඩිප්ලෝමා පාඨමාලාවක් මාස 06කට නොඅඩු හෝ පැය 720 ට නොඅඩු හෝ විය යුතු ය. එම සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමේ දී උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාව මත විශේෂ පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත්‍රය**

I වන කොටස - නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතු ය.

1. අයදුම් කරන තනතුර : ..........................................................

2. නිලධාරියාගේ සම්පූර්ණ නම :..........................................................
   (සිංහලෙන්) ..........................................................

3. නිලධාරියාගේ සම්පූර්ණ නම :..........................................................
   (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..........................................................

4. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6. වර්තමාන සේවා ස්ථානය : ..........................................................

7. ලිපිනය : ..........................................................
   ..........................................................

   දුරකථන අංකය : ස්ථාවර - ☐☐☐☐☐☐☐☐☐☐
   ජංගම - ☐☐☐☐☐☐☐☐☐☐

8. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

9. (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය : ..........................................

   (ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන දිනය : ..........................................

   (ඇ) මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දින සිට උසස් කිරීමේ දිනට සේවා කාලය : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දින සිට වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේද? (තිබේ නම් පහත විස්තර සඳහන් කරන්න)

| කාලය | | අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු සංඛ්‍යාව | කාරණය |
|---|---|---|---|
| සිට | දක්වා | | |
| | | | |

11. පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

ඔව් ☐ නැත ☐

12. (අ) අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයේ I ශ්‍රේණියට අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේද?

ඔව් / නැත / අදාළ නොවේ

(ආ) "ඔව්" නම් සමත් වූ දිනය : ........................................................

13. වෘත්තීය / අතිරේක අධ්‍යාපන සුදුසුකම් සහ රැකියා ක්ෂේත්‍රයට අදාල පුහුණු පාඨමාලා හෝ වැඩමුළු පිළිබඳ විස්තරය

13.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් (වාස්තු විද්‍යා / ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ) :

| අනු අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 01. | ඩිප්ලෝමා | | |
| 02. | සහතික පත්‍ර | | |

13.2 පරිගණක සාක්ෂරතාව :

| අනු අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 01. | පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - ඩිප්ලෝමා හෝ ඊට ඉහළ | | |
| 02. | පුරාවිද්‍යා සංරක්ෂණ/වාස්තු විද්‍යා/ ඉංජිනේරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිගණක යෙදවුම් පිළිබඳ පුහුණුව - සහතික පත්‍ර | | |
| 03. | සාමාන්‍ය පරිගණක පුහුණුව - ඩිප්ලෝමා | | |
| 04. | සාමාන්‍ය පරිගණක පුහුණුව - සහතික පත්‍ර | | |

13.3 රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හෝ වැඩමුළු :

(අ) දෙදින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා : ........................................

..........................................................................................................................

(ආ) එක්දින හෝ ඊට වැඩි වැඩමුළු/පාඨමාලා : ........................................

..........................................................................................................................

14. ඉහත සඳහන් තොරතුරු නිරවද්‍ය හා විශ්වාසී ලෙස මා සපයා ඇති බැව් ප්‍රකාශ කොට සහතික කරමි.

.................................................. ......................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**II වන කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය**

I. මෙම අයදුම්කරු සම්බන්ධයෙන් පූර්වාසන්න වසර 05 තුළ විනය ක්‍රියාමාර්ග ගෙන හෝ ගැනීමට අදහස් කර ඇත / නැත. (ඇත්නම් ඒ පිළිබඳව විස්තර පහත සඳහන් කරන්න)

..............................................................................................................................................

..............................................................................................................................................

II. මෙම අයදුම්කරු I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන තිබේද? ඔව් / නැත ("ඔව්" නම් පහත විස්තර සඳහන් කරන්න)

| අනු අංකය | නිවාඩු ලබාගැනීමට අදාළ කොන්දේසි | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 01. | ආයතන සංග්‍රහයේ V:2.5.4 අනුව | | |
| 02. | ආයතන සංග්‍රහයේ XII:16 අනුව | | |
| 03. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 අනුව | | |
| 04. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 අනුව | | |
| 05. | ආයතන සංග්‍රහයේ XII:36 අනුව | | |
| 06. | අනෙකුත් වැටුප් රහිත නිවාඩු | | |

III. සේවා කාලයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බව ද, නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයාගෙන ඇති/නැති බව ද, උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නැති බව ද,

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයන් පෙන්නුම් කර ඇති/නැති බව ද,

V. අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03) සේවා ගණයේ I ශ්‍රේණියට අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති/නැති බව ත්,

VI. ඒ අනුව, ඔහු/ඇය මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති/නැති බවත්, සහතික කරන අතර මෙම අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි / නිර්දේශ නොකරමි.
(අදාළ නොවන කොටස් කපා හරින්න)

.................................................. ......................................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**III වන කොටස - අමාත්‍යාංශයේ නිර්දේශය**

මෙම අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි / නිර්දේශ නොකරමි.
(අදාළ නොවන කොටස් කපා හරින්න)

........................................ ..........................................................................

දිනය

අමාත්‍යාංශ ලේකම්
අත්සන හා නිල මුද්‍රාව